**පොළොන්නරුව මහා නගර සභාව - 2020**

-----------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පොළොන්නරුව මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) උතුරු මැද පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i) ඈ (iii) උප වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)iv වගත්තියේ සඳහන් අවශ්‍යතාව අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද 1.2.1 (ඈ) ඡේදයේ සඳහන් නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම.**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ඡේදය | මූල්‍ය ප්‍රකාශන සටහන් වල හෙළිදරව් නොකිරීම් | | |
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය - 2017 3.9 ඡේදය | මූල්‍ය ප්‍රකාශනවල අයවැය ගත තොරතුරු එනම් මුල් අය වැය අවසාන අයවැය සහ ඒ අතර ප්‍රමාණාත්මක වෙනස් වීම් ඇත්නම් ඒවාට හේතු හෙළිදරව් කිරීම් ආදිය සිදුකර නොතිබුණි. | කොරෝනා වසංගතය නිසා අපේක්ෂිත මට්ටමට ළඟාවීමට නොහැකි විය. | ප්‍රමිතියේ විධිවිධාන අනුව වෙනස්වීම් වලට හේතු හෙළිදරව් කිරීම් සිදුකල යුතුවේ. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ අවසාන දිනට පැවති රු.4,755,820 ක් වටිනා පුස්තකාල පොත් තොගය වත්කම් ලෙස ගිණුම්ගත නොකර, සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි. | 2019/02(i) චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම්කරණ සටහන් තුල පෙන්නුම් කළ යුතුවේ. | ගිණුම්කරණ ප්‍රමිති සමඟ ඉදිරිපත් කර ඇති පරිශිෂ්ඨය අනුව වත්කම් ලෙස හඳුනාගත යුතුවේ. |
| (ආ) | අයභාර හඳුනා ගැනීමේ සංරචකයක් ලෙස වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ ප්‍රාග්ධන සංචිත යටතේ ඉදිරිපත් කළ යුතුව තිබූ එකතු වටිනාකම රු.1,908,000 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සමාලෝචිත වර්ෂයට අදාල ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වර්ෂය තුල ගැලපීම් කර ඇති බැවින් හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුල කාලච්ඡේදයේ ගැලපීම තුල ඇතුළත්වේ. | සමාලෝචිත වර්ෂයට අදාල ආදායමක් ලෙස හඳුනානොගත යුතු අතර, අතිරික්තයේ/ ඌණතාවයේ හඳුනානොගත් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ සංචිතයක් ලෙස දැක්විය යුතු වේ. |

### 1.6.3 නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ගිණුම් විෂයයන් 12 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා ස්ථාවර වත්කම් ලේඛන අනුව වටිනාකම අතර රු.48,466,282 ක වෙනසක් විය. | පිළිගනිමි. මූල්‍ය ප්‍රකාශනයේ ශේෂය නිවැරදි බැවින් වත්කම් ලේඛනයේ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන සමඟ නිවැරදි උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මහා නගර සභාවේ වියදම ඉක්මවූ අයහාරය රු.13,714,918 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.24,871,603 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **කුලී** | | |
| කඳුරුවෙල බස් නැවතුම්පලේ කඩ කාමර 18 ක හා පොළොන්නරුව රෝහල හන්දිය කඩ කාමර 19 ක හිඟ එක්වන් මුදල රු.2,120,821 ක් වර්ෂ 01 සිට වර්ෂ 21 දක්වා කාල පරාසයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, පොළොන්නරුව පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 40 ක රු.18,088,750 ක ආපසු නොගෙවන අක් මුදල හා එහි කඩ කාමර 46 ක මාසික කුලී වටිනාකම රු.7,756,758 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඳුරුවෙල බස් නැවතුම්පොල කඩ කාමර හිමියන්ට එරෙහිව ඉදිරියේදී අදාල නීති ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. රෝහල් හංදිය කඩකාමර සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙන නිර්දේශය මත ක්‍රියා කරමි. පොළොන්නරුව පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර සඳහා අපේක්ෂිත පහසුකම් හා ගුණත්වය නොමැති නිසා කඩහිමියන් කුලී ගෙවීමට මැලිකමක් දක්වයි. අඩුපාඩු සම්පූර්ණ කළ පසු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරමි. | හිඟ මුදල් අයකරගැනීමට හා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම, පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබූ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| පොළොන්නරුව පොදු වෙළඳ සංකීර්ණයේ විදුලි බලය ලබාගැනීම සඳහා සමූහ සැපයුමක් (Bulk Supply) ලබාගෙන තිබූ අතර, විගණිත දින වන විට ඊට අදාල වූ රු.1,306,208 ක විදුලි බිල් පත්‍ර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම බිල්පත කඩ හිමියන් අතර, අනුපාතිකව බෙදා අයකිරීමට කටයුතු සූදානම් කර ඇත. | ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.2 නිශ්ක්‍රිය වත්කම්**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| තමන්කඩුව ප්‍රාදේශීය සභාව සතුව පැවති වත්කම් හා වගකීම් බෙදාහැරීමේ නිර්දේශ වාර්තාව මගින් පොළොන්නරුව මහා නගර සභාවට හිමි වූ රු. 629,587 ක ශේෂ සහිත බැංකු ගිණුම් 03 ක් නිශ්ක්‍රියව පැවතුණු අතර, ඒවායේ වර්තමාන වටිනාකම හඳුනාගැනීමට මහා නගර සභාව අපොහොසත්ව පැවතුණි. | අදාල ගැටළුව නිරාකරණය කරගැනීමට සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත ලිඛිතව ඉල්ලීම් කර ඇත. | ඵලදායි කාර්යයක් සඳහා උපයෝජනය කළ යුතුවේ. |